# Abstract No 88

## ථෙරවාදී සහ මාධ්‍යමික ශුන්‍යතාවාදී මධ්‍යම ප්‍රතිපදාව එකක් ද? දෙකක් ද?

**ආර්.එම්.එස්.ලක්මාලි රාජපක්‍ෂ**
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශාස්ත්‍රවේදී තෙවන වසර(විශේෂ),කැලණිය විශ්වවිද්‍යාලය
lakmalirajapakshe93@gmail.com

මෙම පර්යේෂණයෙහි පර්යේෂණ ගැටළුව වූයේ බෞද්ධ දර්ශනවාද දෙකක ඉගැන්වෙන නිර්වාණය සඳහා නිර්දිෂ්ට මධ්‍යම ප්‍රතිපදාව එකක් ම ද නැතහොත් වෙනස් ද යන්න විමසීමයි. මාධ්‍යමික දර්ශනයේ ප්‍රධාන ඉගැන්වීම වන්නේ ශුන්‍යතාවාදය යි. ඔවුහු ශුන්‍යතාවාදය ලෙස දක්වා ඇත්තේ ප්‍රතීත්‍ය සමුත්පාදය යි. එම ප්‍රතීත්‍ය සමුත්පාදය ම මධ්‍යම ප්‍රතිපදාව ලෙස අර්ථකථනය කර ඇති අයුරු එම දර්ශනයෙහි ප්‍රධානාචාර්යයෙකු වන නාගාර්ජුනපාදයන් රචිත මූල මාධ්‍යමිකකාරිකාවේ විසි හතර වැනි ශ්ලෝකයෙන් විශද වේ. ථෙරවාදී දර්ශනය මූලික ඉගැන්වීම ලෙස දක්වන්නේ හේතුඵල දහම යි. එනම් ප්‍රතීත්‍ය සමුත්පාදය යි. එහි මධ්‍යම ප්‍රතිපදාව ලෙස අර්ථකථනය කොට ඇත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. මුල් බුදුසමයට අයත් සූත්‍රයක් ලෙස සැලකෙන සහ ප්‍රථම බුද්ධ දේශනාව වන ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ එය දක් වේ. මෙම දර්ශන දෙකෙහි මධ්‍යම ප්‍රතිපදාව විග්‍රහ කොට ඇති ආකාරය විමසීමෙන් පැහැදිලි වන්නේ මාධ්‍යමික දර්ශනය ස්වභාව ලෝකයේ යථාර්ථය හෙවත් ලෝක පැවැත්ම ඇති සැටියෙන් දැකීම මධ්‍යම ප්‍රතිපදාව යනුවෙන් දක්වා ඇති බවත්, ථෙරවාදී දර්ශනය පුද්ගලයාගේ චරිත සංවර්ධනය වන, ක්‍රියාත්මක කළ යුතු යහපත් අංග අටක් මධ්‍යම ප්‍රතිපදාව ලෙස දක්වා ඇති බවත් ය. ප්‍රතිපදාවක් යනු අනුගමනය කළ යුත්තකි. මෙයින් ප්‍රතීත්‍ය සමුත්පාදය අනුගමනය කළ යුත්තක් නොව අවබෝධ කරගත යුත්තකි. ආර්ය අෂ්ටාංගික මාර්ගය යනු අවබෝධ කිරීමෙන් සැහීමට පත් නොවී අනුගමනය කළ යුත්තකි. මේ අනුව පැහැදිලි වන්නේ මෙම දර්ශන දෙක තුළ ඉගැන්වෙන මෝක්ෂප්‍රාප්ත මධ්‍යම ප්‍රතිපදාව සමාන අර්ථයක යෙදෙන ධර්ම මාර්ගයක් හැඳින්වීම පිණිස නොයෙදෙන බව යි.

**ප්‍රමුඛ පදඃ-** ථෙරවාද, ශුන්‍යතාවාද, මධ්‍යම ප්‍රතිපදා, මූලමාධ්‍යමිකකාරිකා, ධම්මචක්කප්පවත්තන